# නිදහස් අරගලය සමග බැඳුණු ආර්ථික, දේශපාලනය සහ සමාජ ක්‍රමය

මහාචාර්ය චන්ද්‍රන රෝහණ විතානාච්චි
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

---

*"ධනය මෙහි අගයකොට නොසැලකෙයි, එයින් යමෙක් සම්මානීය ද නොවේ "*

රොබට් නොක්ස්[50]

කන්ද උඩරට පාලනය ඉංග්‍රීසින්ට නතු වන අවස්ථාව වනවිට උඩරට ජනතාව වඩාත් සන්තෘෂ්ටිකර ජීවිතයක් ගෙවූ පිරිසක් විය. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ආනන්ද කුමාරස්වාමි පවසන්නේ "***උඩරට සිංහලයෝ තෘප්තිකර සභ්‍යත්වයක් සහ කලාවක් ද, වැසියන්ගේ ආගම වූ රාජ්‍යාගමක් ද ඇති අවශ්‍ය හැමදෙයින් සමෘද්ධ නිදහස් මනුෂ්‍ය වර්ගයක් වූහ***" යනුවෙනි.[51] බ්‍රිතාන්‍ය පාලනයට මෙරට පූර්ණ වශයෙන් ම යටත්වීමෙන් පසු ඔවුන් පහසුවෙන් ඔවුන්ගේ පාලනයන්ට විරුද්ධ ව එල්ල වූ බලපෑම් යටපත් කරගැනීමට කටයුතු කළ අතර මේ නිසා ඉංග්‍රීසි ජාතිකයින් තුළ තමන් ස්වදේශිකයින්ට වඩා උසස් පිරිසක් බවට අදහසක් ඇති විය. මේ හේතුවෙන් ඔවුන් මෙරට වෙනත් පංතියක් හෙවත් සමාජ ස්ථරයක් ලෙසින් කටයුතු කර ඇත. ඔවුහු ක්‍රමාණුකූල අධ්‍යාපනයක් ලබා සිටීමත්, රජයේ උසස් නිලතල සියල්ල ඔවුන් අත පැවතීමත්, උසස් ආර්ථිකයකට හිමිකම් පෑමත්, රාජ්‍ය කටයුතු සමග ඍජුව සම්බන්ධවීමට හැකිවීමත් වැනි හේතූන් ද මොවුන් බල සම්පන්න සමාජ ස්ථරයක් ලෙස තත්කාලීන සමාජයේ කටයුතු

---

[50] Knox, Robert., 1681(Digitized 2009), ***An Historical Relation of the Island Ceylon, in the East Indies*** Together with an Account of the Detaining in Captivity the Author and Divers Other Englishmen Now Living There, and of the Author's Miraculous Escape,

[51] කුමාරස්වාමි. ඒ. කේ., 1962, ***මධ්‍ය කාලීන සිංහල කලා***, පරි. එච්. ඇම්. සෝමරත්න, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, පි. 15

කිරීමට හේතු වන්නට ඇත. මෙමගින් 1818 නිදහස් අරගලය සමග බැඳුණු ආර්ථික, දේශපාලනය සහ සමාජ ක්‍රමය පිළිබඳ විමසීමක් සිදුකිරීමට අපේක්ෂිත ය. බ්‍රිතාන්‍යය යටත් විජිතයක් ලෙසට ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වීම ආරම්භ වන අවධිය වන විට මෙරට පැවතියේ පංති භේදය සහ කුල භේදයෙන් යුක්ත වූ සමාජයකි.[52] එය උඩරට සහ පහතරට යනුවෙන් ප්‍රාදේශීය භේදයක් ලෙස ද පැවති බවට සාක්ෂි පවතී. එය යුරෝපියානු ජාතීන් මෙරට ආක්‍රමණය කොට මුහුදුබඩ පළාත් යටත් කර ගැනීමේ සිටම ආරම්භ වූවකි. පෘතුග්‍රීසින් හා ලන්දේසීන්ගේ පාලනයට මුහුදුබඩ ප්‍රදේශ යටත්වීමෙන් පසු එම ප්‍රදේශවල ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය වීමත් බොහෝ පිරිස් එම ආගම වැළඳගැනීමට කටයුතු කිරීමත් සමග යුරෝපියානු සම්ප්‍රදායන්, සිරිත් විරිත්, භාෂා එම ප්‍රදේශවල සීඝ්‍ර ලෙස පැතිරී යාම හේතුවෙන් මුහුදුබඩ ප්‍රදේශය නියෝජනය වෙනස් ආකාරයෙන් කටයුතු කිරීම මෙම ප්‍රාදේශීය භේදය ඇතිවීමට හේතු වූ බව පෙනේ.

බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කරගත් මුල් භාගයේ දී මෙරට සිංහල ජනතාව අතර පැහැදිළි ව ක්‍රියාත්මක වූ පංති ස්ථර දෙකක් පැවතින. ඉන් පළමුවැන්න වූයේ රදල සහ වලව් පැළැන්තිය නියෝජනය කළ ජන පිරිස විය. ඔවුන් අතර රදළ ප්‍රධානීන්, මුදලි, මුහන්දිරම්, කෝරාළ, රටේ මහත්මා, මුලාදෑනි වැනි පිරිස් විය. ඔවුන් සතුව බලය, ඉඩකඩම් සහ මිල මුදල් යහමින් පැවතීම හේතුවෙන් පොදු ජන සමාජය තුළ මොවුන් කැපී පෙනෙන පිරිසක් බවට පත් විය. මෙරට බොහෝ ක්ෂේත්‍රවල පාලන අධිකාරි බලය මෙම පිරිස් සතුව පැවතීම තුළ මෙම දේශීය ප්‍රභූන් පොදු මහජනතාවට බලපෑම් කළ හැකි සමාජ ස්ථරයක් විය. පොදු මහජනතාව දෙවන සමාජ ස්ථරය විය. ඔවුන් අතර වෘත්තිමය ක්ෂේත්‍රය පදනම් කරගත් කුල ක්‍රමය ක්‍රියාත්මක විය.[53] ඒ අනුව මෙරට පැවැතියේ රැකියාවන් පදනම් වූ වෘත්තිය ශ්‍රේණි අනුව සැකසුණ සමාජ ස්ථරායනයක් බව පැහැදිලි ය.[54]

---

[52] Peris, R., 1952, ***Caste, Ethos and Social Equilibrium***

[53] ඩොයිලි, ජෝන්., 2005, ***සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන්***, පරි. එච්. ඇම්. සෝමරත්න, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පි. 79 ; කුමාරස්වාමි, ඒ. කේ., 1962, පිටු 20 සිට.

[54] බස්නායක, එච්.ටී., 2005, ***ශ්‍රී ලංකවේ ශිෂ්ටාචාරය - 03*** ඉංග්‍රීසි පාලන සමය, ගොඩගේ සහ සමාගම, කොළඹ, පි.381

වෘත්තිමය තත්ත්වයක් පදනම් කරගත් කුල ක්‍රමය මෙම සමාජයේ පැවතිය ද එම කුළ ස්ථර අතර ගැටුමක් නොවූ අතර සාමාජීය අවශ්‍යතාවන් සඳහා ඔවුන් සහයෝගයෙන් කටයුතු කර තිබේ.

මෙම සමාජ ස්ථරායනය සැකසීම තුළ තත්කාලීන සමාජය තුළ ක්‍රියාත්මක වූ සමාජ සම්ප්‍රදායන් අඛණ්ඩව පවත්වාගෙන යාම අපේක්ෂා කරන්නට ඇත. ඔවුනොවුන්ට හිමි වී තිබුණ වෘත්තියන් අනුව ඒ සියල්ලම තත්කාලීන සමාජ අවශ්‍යතාවන් මත සකස් වූ සමාජ ශ්‍රේණි බව පැහැදිළි ය. එකළ පැවැති ස්වයංපෝෂිත, සහජීවනයෙන් යුතු සමාජ ආර්ථික ක්‍රමවේදය බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම වෘත්තිය ශ්‍රේණි හෙවත් කුළ ක්‍රමය ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍ය අංගයක් ලෙස පැවති බව පෙනේ.[55] ආවාහ විවාහා වෙනත් සමීප සබඳතාවන් මෙම කුළ අතර නොපැවතිය ද ඔවුනොවුන් අතර සහයෝගයක් මෙන්ම එකඟතාවයක් ද පැවති බව හඳුනා ගැනීමට පුළුවන.

1832 දී ඉදිරිපත් කරන ලද කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී කුලය මත පදනම් ව සකස් වූ සමාජ ස්ථර සම්බන්ධයෙන් නවමු ප්‍රවේශයක් ඇති විය. එම යෝජනාව අනුව අභිමත කෙනෙකුට තමන්ට කුලයෙන් හිමි වූ නිශ්චිත රැකියාවක් වෙත නික්ම යාමේ හැකියාව ලැබී ඇත. මෙරට ඉහළ පරිපාලනයේ නියුතු වූ ඉංග්‍රීසිහු කුලය මත පදනම් ව සිදුකරනු ලැබූ රැකියාවන්ගෙන් එම ජන පිරිස් සඳහා නිදහස් කරලීමට කටයුතු කර ඇත. එහෙත් ඇතැම් පොදු කටයුතු වලදී සමාජයේ ඉහළම ස්ථර මෙන් ම මෙම ස්ථරවලට අයත් ජනතාව ද එකට එකතු වී සහයෝගයෙන් කටයුතු කර තිබූ අවස්ථාවන් ද වේ. 1818 විමුක්ති සටන සඳහා විවිධ කුලවල ජන පිරිස් එකතු වූ බවත් ඔවුන්ගෙන් ඇතැමෙක් සටන් පෙරමුණෙහි ලා කටයුතු කළ බවට සාක්ෂි පවතී.[56]

---

55 එම

56 D'Oyly, J., 1995, ***Diary of Mr. John D'Oyly*** India, Navrang,; තෙන්නකෝන්, ඩබ්. *උඩරට මහ කැරැල්ල* (2 කාණ්ඩය), සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1962,

ඉංග්‍රීසින් මෙරට යටත් කරගන්නා අවධිය වන විට මෙරට පැවතියේ බෞද්ධාගමික මුහුණුවරක් ගත් අධ්‍යාපනයකි. එය දුරාතියේ සිට පැවති විහාරස්ථානය සමග බද්ධ වූ අධ්‍යාපන ක්‍රමවේදයක් විය. එහෙත් බ්‍රිතාන්‍ය පාලන සමයේ දී එනම් 1812 සිට මෙරට පැමිණි මිෂනාරිවරුන් ක්‍රිස්තියානි ආගම මුල්කරගෙන අධ්‍යාපන ක්‍රමවේදයක් ආරම්භ කරන ලදි.[57]. මෙහි මූලාරම්භය මුහුදුබඩ ලන්දේසි පාලන අවධිය තුළ සිදු වූ බවට සාක්ෂි පවතී. ඉංග්‍රීසිහු ද තම අධ්‍යාපන ක්‍රමවේදය ප්‍රථමයෙන් ආරම්භ කොට ව්‍යාප්ත කරන ලද්දේ මුහුදුබඩ, පහතරට කලාපයේ සහ යාපනය ආදි ප්‍රදේශවල ය. ආරම්භයේ දී ආගම ප්‍රචාරය කිරීමේ පරමාර්ථයෙන් ස්වදේශිකයින් හට අධ්‍යාපනය ලබාදීම ආරම්භ කෙරුණ ද, 1832 දී කෝල්බෲක් යෝජනාවලිය මගින් යෝජනා කර ක්‍රියාත්මක කරන ලද්දේ ස්වදේශිකයින්ට මෙරට පරිපාලන කටයුතුවලට සම්බන්ධ විය හැකි ආකාරයේ අධ්‍යාපනයක් ලබාදීම ය.[58] දේශීය සම්ප්‍රදායන්ට ගැලපෙන පරිද්දෙන් සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා දේශීය ජනතාවට අවස්ථාව ලබාදිය යුතු බවට කෝල්බෲක් තුල පැවති අදහස ඒ අනුව ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට මුල්තැන ලබාදෙමින් අධ්‍යාපන ක්‍රමවේදයක් සැකසීමට ඔහු කටයුතු කරන ලදි. ඒ අනුව පාසල් පිහිටුවීම මගින් අධ්‍යාපන ක්‍රමවේදය ව්‍යාප්ත කරලීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් මෙම අධ්‍යාපන කටයුතුවල දී බෞද්ධයන් ඉගැන්වීම් කටයුතුවලින් ඉවත් කර තැබීමට කටයුතු කර ඇත. මෙම ක්‍රියාවට අභියෝගයක් ලෙස බෞද්ධ ජනතාව ද මෙරට බෞද්ධ පාසැල් ආරම්භ කිරීමට කටයුතු කළ අතර මුල්ම බෞද්ධ පාසැල දොඩන්දූවේ පියරතන හිමියන් විසින් 1869 දී දොඩන්දූව ප්‍රදේශයේ ආරම්භ කරනු ලැබී ය.[59] මේ සඳහා මූලික ප්‍රවේශයක් ලැබුණේ බෞද්ධ ප්‍රභුවරුන් සහ භික්ෂූන් වහන්සේලා විහාරස්ථාන කේන්ද්‍ර කරගෙන පිහිටවූ අධ්‍යනය ලබාදීමේ පරමාර්ථයෙන් යුතු සමිති සමාගම් හේතුවෙනි. ඒ අනුව එතෙක් පැවති පිරිවෙන් අධ්‍යාපනය තවදුරටත් වර්ධන කිරීමක් ලෙස දැක්විය හැකි ය. බෞද්ධ පාසල් අධ්‍යයනය 19 සියවස අග භාගය වන විට සීඝ්‍ර වර්ධනයක් ලබා ඇත. ඒ සඳහා බුදු දහම වැළඳගත් විදේශික

---

[57] බස්නායක, එච්.ටී., 2005, පිට 403.

[58] එම

[59] එම. පිට 407

ප්‍රභූවරුන්ගේ සහාය මෙරට බෞද්ධ ප්‍රභූන් වෙත ලැබිණ. රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන, පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීම මෙරට බෞද්ධ අධ්‍යාපනයේ වැදගත් සංධිස්ථානයක් වූ අතර එමගින් විවිධ විෂය ක්ෂේත්‍ර ඉගැන්වීමට අවකාශ ලැබිණ.

බ්‍රිතාන්‍ය ජාතීහු මෙරට යටත් කරගන්නා කාලය වන විට උසස් දේශිය සාහිත්‍යයක් ශ්‍රී ලංකාවේ පැවතිණ. එය දීර්ඝ කාලයක් පුරා පැවැති සාහිත්‍ය කටයුතුවල තවත් එක් අවස්ථාවක් සනිටුහන් කරනු ලැබේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ දී ඇති වූ ශාසනික ප්‍රබෝධය තුළ සංඝරාජ හිමියන්ගේ නායකත්වය තුළ සිදුකළ විවිධ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් තත්කාලීන සමාජයේ සාහිත්‍යයේ වර්ධනයක් ද ඇති විය. සංඝරාජ හිමියන් විසින් ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබූ සිටිනාමළුවේ ධම්මජෝති හා කරතොට ධම්මාරාම වැනි හිමිවරුන් පහතරට ප්‍රදේශයේ ද සාහිත්‍ය වර්ධනය කිරීමට දායක විය. මහනුවර රාජධානිය බිඳ වැටෙන කාලය වන විට සාහිත්‍ය කෘතීන් රාශියක් බිහි වී තිබේ. ඒ අතර *ශෘංගාලංකාරය, මණිචෝර ජාතක කාව්‍ය, සාරාර්ථ සංග්‍රහය, කහ කුරුළු සංදේශය, සාරාර්ථ දීපනී, බාලවතාර සංග්‍රහ, වියොවග රත්නමාලය, සිංහල විමාන වස්ථ-ප්‍රකරණය, සිංහල දළදා වංශය, සඟ රාජ විත්තිය, අසදෘස දා කව* වැනි කෘතීන් විය.[60] කෝට්ටේ යුගයේ වර්ධනය වූ සංදේශ සාහිත්‍ය මහනුවර රාජධානි සමයේ ද තිබුණු අතර 1815 පසුව ද පැවතී ඇත. ඒ අනුව දිය සැවුල් සන්දේශය (1815), කිරළ සන්දේශය (1815), තිසර සන්දේශය (1836), මයුර සන්දේශය (1859) වැනි සන්දේශ කෘතීන් රචනා වී ඇත.[61]

19 වන සියවසේ මුල් භාගයේ දී මිෂනාරීන් විසින් මුද්‍රණ යන්ත්‍ර මෙරටට ගෙන්වමින් ආගමික පත පොත මුද්‍රණය කිරීමට කටයුතු කළ අතර ඉන් දශක කිහිපයකට පසු බෞද්ධයන් මුද්‍රණාල පිහිටුවමින් බෞද්ධ පත පොත එළිදැක්වීමට කටයුතු කර තිබේ. මේ හේතුවෙන් එතෙක් පුස්කොල ලේඛන වලට

---

60 සන්නස්ගල, පී.බී., 1961, ***සිංහල සාහිත්‍ය වංශය***, ලේක් හවුස්, කොළඹ.
61 එම. පිටු 465 සිට

පමණක් සීමා වී තිබූ බෞද්ධ ග්‍රන්ථ සහ විවිධ ඓතිහාසික මූලාශ්‍රය ග්‍රන්ථ මුද්‍රණයෙන් එළිදැක්වීමටත් විවිධ සංස්කෘතික ප්‍රකාශයට පත්වීමට හැකි විය.

කෝට්ටේ යුගය වන විට වෙරළබඩ තීරයේ ද, දකුණු පළාතේ ද පමණක් නොව දිවයිනේ බොහෝ ප්‍රදේශවල බෞද්ධාගමික ප්‍රබෝධය වඩාත් උසස් අන්දමින් පැවතිණ. එහෙත් මුහුදුබඩ ප්‍රදේශය යටත්විජිත වාදීන්ගේ යටතට පත්වන විට බුදුදහම ආරක්ෂා කිරීමේ කාර්යභාරය වගකීමක් ලෙසින් පැවරුනේ උඩරට රාජධානියට ය. දකුණු පළාතේ විසූ උගත් භික්ෂූන් රාශියක් පෘතුගීසි ලන්දේසි පාලන අවධිය තුළ උඩරටට සම්ප්‍රාප්ත වී තිබේ. කෙසේ වෙතත් මෙම කාලය තුළ උඩරට භික්ෂු ශාසනය ද පිරිහීමට ලක් වී තිබූ අතර භික්ෂූන් විශාල පිරිසක් ගණින්නාන්සේලා ලෙස කටයුතු කරන ලදි.[62] මෙම කාලය අතරතුර වැලිවිට සරණංකර හිමියන් විසින් භික්ෂු ශාසනය යළිත් ප්‍රතිසංස්කරණය කරලීමටත්, බුදු දහම ආරක්ෂා කරලීමටත් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ සඳහා උන්වහන්සේ විසින් ආරම්භ කරන ලද සිල්වත් සමාගම හා වැලිවිට සමාගම වැනි ආගමික ව්‍යාපාර හේතු විය.

උඩරට රාජධානිය තුළ ක්‍රියාත්මකව සිටි දේශීය ප්‍රභූ පැළැන්තිය තාවකාලික වශයෙන් මුලාවකට ලක්කොට ඉංග්‍රීසීන් ඔවුන්ගේ අභිප්‍රායන් ඉටුකර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් උඩරට ගිවිසුමේ පස්වන වගන්තිය තුළ අදහසක් ලබාගත හැකි බව පැහැදිලි ය.[63] ඒ අනුව උඩරට ප්‍රභූන්ගේ නිලතල හා අයිතිවාසිකම් වරප්‍රසාද ආරක්ෂා කරලීමට ගිවිසුමෙන් පොරොන්දු වූ බව සඳහන් කොට ඇත.[64] එමෙන් ම ජනතාව එතෙක් අනුගමනය කළ ජන සම්මත චාරිත්‍ර වාරිත්‍ර දේපළ අයිතිවාසිකම් ආදිය සුරකෙන බවට කර තිබෙන ප්‍රකාශයෙනුත් බුදු දහමට හානියක් නොකොට වෙහෙර විහාර, භික්ෂූන් හා බෞද්ධාගමික චාරිත්‍ර

---

[62] බස්නායක, එච්.ටී., 2005, පිට 216

[63] එම. පි. 161

[64] Wimalananda, T., 1970, ***The Great Rebellion of 1818***, M.D. Gunasena and Co, Colombo.

චාරිත්‍ර ආරක්‍ෂා කරන බවට ද ගිවිසුමෙන් පොරොන්දුවක් ලබා දී තිබේ.[65] එහෙත් එම පොරොන්දු කෙතෙක් දුරට ඉංග්‍රීසීන් විසින් ආරක්ෂා කලාද යන්න සම්බන්ධයෙන් ගැටළු පවතී.

මහනුවර යුගයේ පැවති සාම්ප්‍රදායික වෘත්තීන් හා කලා කටයුතු බිඳවැටීම කෙරෙහි උඩරට ගිවිසුම ඍජු බලපෑමක් ඇතිකොට තිබේ. විශේෂයෙන් ම එක් එක් වෘත්තීන්හි කටයුතු කළ කුල සම්ප්‍රදායන් එකළ සමාජයේ ක්‍රියාත්මක විය.[66] එහෙත් ඔවුන්ගේ වෘත්තිමය ක්‍රියාකාරකම්වලට ගිවිසුම මගින් කිසිදු අනුග්‍රහයක් නොලැබීම තුළ මෙම තත්ත්වය උදාවී තිබේ. රන් රිදී වැඩ, ආභරණ කර්මාන්තය වැනි පුළුල් කලා කර්මාන්තයන් හි නිරතව සිටි නවන්දන්න කුලය තුළ පැවති උප කුල මේ නිසා සම්පූර්ණයෙන් ම අභාවයට ගිය අතර මේ හේතුවෙන් ඇතැම් වෘත්තීන් ද විනාශවිය. නිදසුනක් ලෙස ගත් කළ මෙම කුලයේ උප කුළ වූ කම්මල්කරුවන් ලෙස කටයුතු කළ ආචාරි කුලය, රන් රිදි වැඩ හෙවත් ආභරණ කර්මාන්තයේ නියුතු බඩහැල් කුලය, පාෂාණ ඔප මට්ටම් කිරීම සිදුකළ ගලගාන්නෝ, ගල් කැටයම් ශිල්පයේ නියුතු ගල් වඩු කුලය, බිතු සිතුවම් ඇඳීමේ නියුතු වූ හිත්තර කුලය, ඇත්දත් කැටයම් ශිල්පයේ නියුතු ලියනවඩු කුළය, පිත්තල කර්මාන්තයේ නියුතු ලෝකුරු කුලය වැනි උප කුල අතරින් ඇතැම් කුල[67] ක්‍රමයෙන් අභාවයට ගිය අතරම එම වෘත්තීන්හි නියුතු පිරිස් අඩුවීම තුල එම සුළු කලා ශිල්ප වෘත්තීන්ට ද තත්කාලීන සමාජය තුළ අභියෝගයක් එල්ල විය.

දීර්ඝ කාලයක් පුරා පැවති සාම්ප්‍රදායික දේශීය කලා කටයුතු අඩපණ වීම මෙම කාලය තුළ දක්නට ලැබෙන්නකි. විශේෂයෙන් ම රජවාසල, වෙහෙර විහාර කේන්ද්‍රකරගෙන සිදුකළ නර්තන කටයුතු වල ප්‍රබල බිඳ වැටීමක් ඉංග්‍රීසින් මෙරට යටත්කර ගැනීමෙන් පසු සිදුවී තිබේ. එයට හේතු වූයේ එතෙක් එම ශිල්ප පරම්පරාවන්ට තම සේවය සැපයීම වෙනුවෙන් හිමිවී තිබූ දිවෙල්ගම්වල අයිතිය

---

[65] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, ***උඩරට රාජධානිය 1470-1818***, සී/ස ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම, පන්නිපිටිය, පි. 160 සිට

[66] පීරිස්, රැල්ෆ්, 2001, ***සිංහල සමාජ සංවිධානය***, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පිටු 183 සිට

[67] එම. පිට 394

ඔවුන්ට අභිමීවියාම තුළ ජීවිකාව පවත්වාගෙනයාමට තරම් ආදායමක් ලබාගැනීමට නොහැකිවීම ය. එම නිසා ඔවුන් එම කලා වෘත්තියෙන් ඉවත්ව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වූ අවස්ථා ද තිබේ.

මහනුවර රාජධානිය බිඳ වැටෙනවිට පැවතියේ පුද්ගල සහසම්බන්ධතාවය මත ගොඩනැගුණු සමාජයකි. එහෙත් ඉංග්‍රීසි පාලනය තුළ අන්‍යෝන්‍ය සහයෝගයට වඩා මුල්තැන ලැබුනේ මුදල්වලට ය. මේ හේතුවෙන් මුදල් භාවිතය හා ගනුදෙනු මත පදනම් කරගත් වෙළෙඳ ක්‍රමවේදයක් මත සකස් වූ සමාජයක් මෙරට තුළ බිහිවූ අතර මෙමගින් අනාදිමත් කාලයක් පුරා පවත්වාගෙන ආ සාරධර්ම පිරි සමාජයේ පරිහානිය උදාවිය. මෙම තත්ත්වය වඩාත් හානිකර ලෙස බලපාන ලද්දේ මෙරට ග්‍රාමීය ජනතාවට ය. එයට හේතුව වූයේ පහතරට හා මුහුදුබඩ සමාජය මේ වන විට ඇතැම් බටහිර ලක්ෂණවලට හුරුවෙමින් පැවති නිසා ඉංග්‍රීසින්ගේ තාන්නමාන්න ලබාගැනීම උදෙසා ඔවුන් ඉංග්‍රීසි පාලකයින් සමග කටයුතු කිරීමට පෙළඹී තිබිණ. ඔවුහු ඉංග්‍රීසි පාලනය තුළ උඩරට සමාජයේ ද විවිධ තනතුරු ආදිය ඉසිලූ හෙයින් ඔවුන් අතරින් වේතන සමග මධ්‍යම පාන්තිකයන් එම සමාජයේ ද ක්‍රියාත්මක විය. උඩරට හා තදාශ්‍රිත කලාපයන්හි සාමාන්‍ය ගැමි ජනතාව සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී මෙම පිරිසගේ ද මැදිහත්වීම හා ඉංග්‍රීසින්ට උඩරට ජනතාවගේ හැඟීම් පිළිබඳ අවබෝධයක් නොමැතිවීම තුළ ගනු ලැබූ තීරණ උඩරට සාම්ප්‍රදායික ජන සමාජයේ පූර්ණ බිඳ වැටීමකට හේතු විය.

සාම්ප්‍රදායික සිංහල සිරිතට බෙහෙවින් ම වෙනස්වූ ක්‍රියාකාරකම් ඉංග්‍රීසි පාලන අවධියේ දී මෙරට ක්‍රියාත්මක විය. මෙම ක්‍රියාකාරකම් ජනතාව වෙතට ආරෝපණය කිරීමට ඉංග්‍රීසින් මෙන්ම එම පන්තියට හැඩ ගැසුණු මෙරට මධ්‍යම පාන්තික ජනතාව ද කටයුතු කරන ලදි. ක්‍රිස්තියානි ආගමේ පවතින සිරිත් විරිත් ඇදහිළි ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමට උත්සහා ගත් අතර ඒ සඳහා උවමනා කෙරෙන මුදල් වියදම් කිරීමට ද මෙම පිරිස් පසුබට වී නොමැත.

විවිධ බාධක මධ්‍යයේ අවිඡින්නව පැවති දේශීය කලාවේ පරිහානියක් ඇතිව අවධියක් ලෙස 1815 පසු උදාවූ කාල පරිච්ඡේදය පෙන්වාදීමට පුළුවන. කලාව යනු රටේ ජනතාවගේ ආගමික, කලාත්මක සහජීවනක්‍රියාවලිය සමග බද්ධවූවකි.

එය කිසියම් ජන සමාජයක පවත්නා සංස්කෘතිය පිළිබඳ ව වන සංකේතාත්මක අගය ලෙස ද පෙන්වාදීමට පුළුවන. පෙරදිග සංස්කෘතියට සම්බන්ධවූ මෙරට දේශීය කලාව හා සම්ප්‍රදායන් එයට කිසිසේත්ම නොගැලපෙන රුචිකත්වයන්ගෙන් සහ අභිමතාර්ථයන්ගෙන් යුතු බටහිර හෙවත් අපරදිග සමාජයේ සංස්කෘතින් සමග සම්බන්ධවීම සිදුනොවන්නක් බව කුමාරස්වාමි පවසා ඇත.[68]

1815 වන තෙක් පැවති මෙරට රාජ්‍යත්වය, ප්‍රභූන් සහ සාමාන්‍ය ජනතාව විසින් සාම්ප්‍රදායානුකූලව පවත්වාගෙන ආ දේශීය සිරිත් විරිත් සම්ප්‍රදායන් ඉංග්‍රීසි පාලනය තුළ නීතිමය තත්ත්වයන් තුළ ක්‍රියාත්මක කරවීමට යාම තුළ දේශීය සමාජය තුළ අඛණ්ඩව ආරක්ෂාවූ මෙරට කලාවේ එතෙක් පැවති ප්‍රාණවත් ස්වරූපය අහෝසි වී යාමට කටයුතු යෙදිණ. එය නර්තන කලාව, වාද්‍යකලාව, ගෘහ නිර්මාණ කලාව, කැටයම් සහ මූර්ති කලාව යන සියලුම ක්ෂේත්‍රයන්ට පොදුවූවක් විය.

සාහිත්‍ය මෙන් ම කලාව ද ආරක්ෂා කරගත හැකිවන්නේ නිදහස් මනසකින් යුතු දේශීය ජනතාවට පමණි. එය ඔවුන් තුළ හදවතින් ඇතිවිය යුත්තකි. ජනතාව තුළ පවතින නිදහස් මානසිකත්වය කලාව කෙරෙහි ඔවුන් තුළ පවතින උනන්දුව සහ ප්‍රබෝධය ඇතිකරලීමට හේතු වේ. එහෙත් උඩරට රාජධානිය බිඳ වැටී තමන් වෙනත් ජාතියක් යටතේ සිටින බවට හැඟීමක් මෙරට ජනතාවගේ සිතෙහි ජනිතවීම, එතෙක් ඔවුන් තුළ කලාව කෙරෙහි පැවති හැඟීම් සම්පූර්ණයෙන් ම බිඳ වැටීමට හේතුවූ බව සිතිය හැකි ය. මෙම කාලය තුළ පිරිහී ගිය කලාවේ සෙවණැලි ඇතැම් විහාර බිතු සිතුවම් මගින් මනාව අවබෝධ කරගත හැකි ය. දඹුලු විහාරයේ හෝ දෙගල්දොරුව විහාරයේ දක්නට ලැබෙන බිතු සිතුවම් සම්ප්‍රදායේ අඛණ්ඩකරණයක් පශ්චාද් අවධියේ දක්නට ලැබුණ ද එම සිතුවම්වල බෙහෙවින් ම පිරිහී ගිය ලක්ෂණ දක්නට ලැබෙන්නේ ඒ නිසා ය.

උඩරට ගිවිසුම ඉංග්‍රීසි ආණ්ඩුව සහ මෙරට පරිපාලන ප්‍රභූ අතර ඇතිකරගත් ගිවිසුමක් වුවද එහි බලපෑම තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජයේ සෑම ක්ෂේත්‍රයකට

---

[68] කුමාරස්වාමි. ඒ. කේ., 1962, පිට 16

ම එකසේ බලපාන ලදි. එහෙත් ඒ බව මෙරට ප්‍රභූන්ට අවබෝධ වූයේ එය ක්‍රියාත්මක වී වසරක පමණක කාලයක් ගතවූ පසුව ය. මෙම ගිවිසුමේ දැක්වෙනු ලබන එක් වගන්තියකින් රජු හා ඔහුගේ නිලධාරීන් යටතේ තිබූ මෙරට ආර්ථිකය හැසිරවීමේ බලය සහ හැකියාව ඉංග්‍රීසින් තමන් යටතට පූර්ණ වශයෙන් ම පවරාගෙන තිබෙන බව පෙනේ. **'සිංහලෙ රටවල් වල රාජ නියමවල් ද, ආදායම ද, මහා රාජෝත්තමයන් වහන්සේගෙ වැඩට සහ මෙ රටේ ආඥාව වර්ධනය වීමට ද යුතු වූ සිරිත් ප්‍රකාර ඉන්ග්‍රීසි ගොවැර්න්නමෙන්තුව වෙනුවෙන් තැබෙන ඒජැන්ට් යන නිළමක්කාර තැනගේ යටතෙ එක්කාසු කරන්ඩ යෙදෙනවා ඇත.[69]'** ඒ අනුව අය කරන ලද බදු මුදල් ඉංග්‍රීසින් විසින් තම රජු වෙනුවෙන් අයකිරීමේ බලය මෙම ගිවිසුමෙන් ලබාගෙන තිබෙන බව පැහැදිලි ය. එය මෙරට පැවති සාම්ප්‍රදායික ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කිරීමට සමත් වූවක් විය. **'මේ රටවල් වල වෙළ හෙලදාම් වර්ධන වෙන පිණිස මෙහි උපදින දේ වෙලදාම් පිණිස ගෙන යාම පාසු වෙන හැටියට ද මුදල්, රෙදි එනු නොහොත් සිංහලේ වැසියො වැඩි කැමති ඇතිවෙන බඩු ඒ පිනිස ගෙන ඒම පාසු කරන ලෙස ද ...............'**[70] යන වගන්ති ඛණ්ඩයෙන් ආනයන අපනයන අයිතිය ලබාගෙන තිබෙන බව තහවුරු වේ. ඒ අනුව වෙළඳාම සඳහා පූර්ණ අවකාශයක් ඉංග්‍රීසීන් විසින් සකස් කරලීම තුළ දේශීය ජනතාවට සාම්ප්‍රදායික යැපුම් ක්‍රියාවලිය තුළ ජීවත් වීමට තිබූ අවකාශය අවහිර කිරීමක් විය.

උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශවල සාම්ප්‍රදායික ආර්ථික ක්‍රියාවලියේ බිඳ වැටීමට ද ඉංග්‍රීසින් විසින් අනුගමනය කරන ලද මෙම ක්‍රියාවලිය හේතු විය. මහනුවර ප්‍රදේශයේ පරිපාලන කටයුතු කරගෙන යාමට නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමත්[71] ඒ ඔස්සේ පරිපාලනය පමණක් නොව වාණිජ කටයුතු වලට සම්බන්ධ වී ආදායම් බදු අයකරගැනීම් වැනි ආර්ථික කටයුතු සිදු කිරීමත් තුළ එතෙක් පැවති රාජාණ්ඩු පාලනයේ පැවැති බලතල අඩු කරමින් නව ක්‍රමවේදයක් තුළ ඉංග්‍රීසින් පාලන කටයුතුවලට මැදිහත්වීම සිදුකර ඇත.

---

69 අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පිට 163

70 එම. පි. 163

71 බස්නායක, එච්.ටී., 2005, පි. 52

1815 උඩරට ප්‍රකාශය කළ දැක්වෙන 'රටේ සියලුම ආදායම් ඉංග්‍රීසි රජයට හිමිය' යන වගන්තිය තුළින් සහ මහනුවර රාජ්‍ය තුළ සියලු වෙළඳ කටයුතු කරගෙන යාම බ්‍රිතාන්‍ය රජයේ නියෝගයන් පරිදි සිදුවිය යුතු ය යන වගන්තීන් මගින්[72] මගින් එතෙක් මෙරට තුළ ක්‍රියාත්මක වූ දේශීය ආර්ථික ක්‍රියාවලිය බ්‍රිතාන්‍යයන්ගේ වුවමනාවන් සඳහා හැසිරවීමට බලය ලබාගෙන තිබෙන බව පැහැදිළි ය. ඒ අනුව එතෙක් පැවැති වී වගාව, හේන් වගාව ප්‍රධාන කොටගත් එදිනෙදා පරිභෝජනය සඳහා වන ආහාර නිෂ්පාදනය වෙනුවට ඉංග්‍රීසින් වෙත වැඩි ආදායම් උපදවා ගත හැකි ස්ථිර වැවිලි බෝග වගාවන් සඳහා යොමුවීමේ අදහස මෙම ගිවිසුම සකස් කරන අවස්ථාවේ සිටම ඉංග්‍රීසින් සතුව පැවැති බව තහවුරු වේ.

බ්‍රිතාන්‍යයන් ලංකාවේ බලය පූර්ණ වශයෙන් ම අත්පත් කර ගන්නා කාලය වන විට කුඹුරු හා හේන් ගොවිතැන[73] ප්‍රධාන අර්ථික ක්‍රමය වූ මුත් එය ඊට පෙර වියළි කලාපීය ප්‍රදේශ ආශ්‍රිත ව පැවති වාරි ජල සම්පාදනය මගින් සිදුකළ මහා පරිමාණ කෘෂි කාර්මික කටයුතු වලට වඩා වෙනස් වූවක් විය. ඒ වන විට නිසි පරිදි නඩත්තු සිදු නොවීමෙන් එම කලාපයන් හි වාරි කර්මාන්තයන් බිඳ වැටී තිබුණු හෙයින් ජනතාවගේ වඩාත් ආකර්ෂණීය ප්‍රදේශය වූයේ කඳුකරය හා නිරිතදිග කලාපයයි. එම ප්‍රදේශවල වී ගොවිතැන වර්ෂා ජලය මත පදනම් ව සිදු විය. එමෙන් ම පුළුල් ලෙස විහිදී ගිය තැනිතලා භූමි එම කලාපය ආශ්‍රිත ව පිහිටා නොතිබීම තුළ ඔවුහු වී ගොවිතැන කරන ලද්දේ කඳු අතර වූ පහත් බිම් පදනම් කර ගනිමිනි. මේ නිසා වී ගොවිතැනින් ජනතාවට ලැබුණු ප්‍රයෝජන ඉතා අල්ප විය. මේ හේතුවෙන් ඉංග්‍රීසින්ට ස්වදේශික ජනතාවගේ ගොවිතැන්වලින් ලබාගත හැකි ආදායම ඉතාමත් සීමිත විය. මේ හේතුවෙන් ඉංග්‍රීසින් වැඩි ආදායම් ලබාගත හැකි විකල්ප ස්ථාවර වගාවන්ට යොමු විය. වෙළඳාම මෙරට ආර්ථික ක්‍රමයක් ලෙස පැවතුණ ද එය සිංහල ජනතාවට මුස්ලිම් ජනතාව අතර වැඩි වශයෙන් ක්‍රියාත්මක වූවක් විය. කෙසේ වෙතත් මිළ මුදල් සීමිත වූ මෙම කාල පරිච්ඡේදයේ දී වෙළඳාම භාණ්ඩ හුවමාරු ක්‍රමය මත වැඩි වශයෙන් පවත්වාගෙන ගිය බව පැහැදිළි වේ.

---

[72] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පි. 163.

[73] පීරිස්, රල්ෆ්, 2001, පිටු 75 සිට

බ්‍රිතාන්‍ය පාලනය ආරම්භක අවධිය තුළ එතෙක් පැවති රාජකාරි ක්‍රමය වැනි නොමිලේ ශ්‍රමය ලබාදීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් දුර්වල වීම තුළ වෙල්ලස්ස, පහළ ඌව, සත් කෝරළය වැනි ප්‍රදේශවල වාරි කර්මාන්තය ප්‍රබල ලෙස පසුබෑමකට ලක් වී තිබේ. නිසි නඩත්තුවක් නොමැති වීම තුළ එම වාරි කර්මාන්ත සීඝ්‍ර ලෙස බිඳවැටීමට ලක් වී තිබේ. මේ නිසා වාරි කර්මාන්ත පදනම් ව ගොඩ නැගුණු වී වගාව වැනි සාම්ප්‍රදායික කෘෂිකර්මාන්ත කටයුතු පරිහානියට ලක් විය. මේ නිසා තත්කාලීන සමාජයේ ජනතාවට සහල් හිඟයක් ඇති විය. එය මෙරට ජනතාවගේ අර්ථ ක්‍රමයට බෙහෙවින්ම බලපාන්නට ඇත. මේ වන විට ලංදේසි පාලන අවධියේ සිටම විදේශයන්ගේ සහල් ආනයනය කොට වෙරළබඩ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම නිසා ඔවුන්ට ආහාර හිඟතාවය ගැටළුවක් නොවී ය.[74] නමුත් මෙම නුහුරු ක්‍රමවේදය එනම් පිටරටින් සහල් ගෙනවුත් පරිබෝජනය කිරීමට උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශවල ජනතාව කැමැත්තක් නොදැක්වීය. මේ හේතුවෙන් මෙම ප්‍රදේශවල ජනතාවගේ සාම්ප්‍රදායික පරිබෝජන රටාව බිඳ වැටීමකට ලක් වී තිබේ. එය තත්කාලීන සමාජයේ ආර්ථිකය බිඳ වැටීමට ප්‍රබල හේතුවක් විය.

උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශයන් හි රදළ පිරිස් හා සාමාන්‍ය ජනතාව තුළ පැවතියේ එකම ආකාරයේ අරමුණු බව ටිකිරි අබේසිංහ පෙන්වා දෙයි.[75] නමුත් දෙපිරිසම එකම අර්ථ ක්‍රමයක සාමාජිකයෝ වූහ. කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගත් මෙම දෙපිරිස සතුවම ඉඩකඩම් පැවතින. රදළ පිරිස්වලට අයත් ගොවිබිම්වල පමණක් නොව තමන්ගේ ද ඉඩකඩම්වල ඔවුහු වගා කටයුතු කරන ලදි. ආරක්ෂාව මෙන් ම අනෙකුත් කාර්යයන් වලදී ද දෙපිරිස අතර පැවතියේ අන්නෝන්‍ය සහයෝගීතාවයකි. ඒ අනුව දෙපිරිස අතරම පැවතියේ එක සමාන ආකාරයේ ආර්ථික ක්‍රියාවලියක් බව පැහැදිළි ය.[76] මේ හේතුවෙන් බ්‍රිතාන්‍යයන්ගෙන් එල්ල වූ පීඩනය දෙපිරිසට ම එක හා සමාන ලෙසින් දැනෙන්නට විය. සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක වූ ආර්ථික ක්‍රියාවලිය බිඳ වැටීම දෙපිරිසටම එක හා සමාන ලෙසින් දැනෙන්නට ඇති බව සිතිය හැකි වේ.

---

[74] බස්නායක, එච්.ටී., 2005, පි. 321
[75] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පි. 131.
[76] එම

බ්‍රිතාන්‍ය ආගමනය තුළ සිංහල ජනතාවගේ ආර්ථිකය බෙහෙවින් දුර්වල වී ගිය අතර වෙළඳාම මත ආර්ථික කටයුතු සිදුකළ මුස්ලිම් ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වන්නට විය. මුස්ලිම් ජනතාව ඉංග්‍රීසින් සමග සමීපව කටයුතු කොට ඔවුන්ගේ ප්‍රවාහන සහ සේවා සැපයීම ආදී කාර්යයන් ඉටුකරමින් මුදල් ඉපැයීමට සමර්ථකම් දක්වන ලදි. මෙවැනි ක්‍රියාවන් තුළින් මුදල් ඉපැයීමත්, මුස්ලිම් ජනතාව ශක්තිමත් වීම කෙතරම් ද යත් ඇතැම් අවස්ථාවල සිංහල බෞද්ධයින් සමග ගැටුම් ද ඇති කරගන්නා ලදි. මෙම තත්ත්වය උඩරට සිංහල ජනතාව නොරිස්සූ කාරණයක් විය.

1818 කැරැල්ල මර්දනය කරලීම සඳහා බ්‍රිතාන්‍යයන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය 'දුර්භික්ෂය, අසිපත හා ගිනිදැල්ල' යන වචන තුනෙන් හැඳින්වූ අතර ඒ සඳහා පොදුවේ ව්‍යවහාර කරන ලද්දේ 'බිම් පාළු ප්‍රතිපත්තිය' යනුවෙනි. ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වී දිවයිනේ බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත වූ 1818 කැරැල්ල ලෙසින් හඳුන්වන ජනතා නැගිටීම මර්දනය කරලීම පිණිස එවකට සිටි ආණ්ඩුකාරවර **රොබට් බ්‍රව්න්රිග්** ගේ උපදෙස් පරිදි බිම් පාළු ප්‍රතිපත්තිය තුළ විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව ඔවුන්ගේ ලිපි සහ ලේඛනවලින් තහවුරු වේ.[77] වයස අවුරුදු 18 වැඩි සියලුම පිරිමින් මරාදැමිය යුතු බවත්, නිවාස ගිණි තබා විනාශකළ යුතු බවත්, ආහාරයට ගතහැකි පළතුරු හටගන්නා සියලු ශාඛ කපා විනාශකර දැමිය යුතු බවත්, සියළුම ධාන්‍ය විනාශ කළ යුතු හෝ රාජ සන්තක කළ යුතු බවත්, වාරි මාර්ග වැව් සහ ඇළ වේලි විනාශ කළ යුතු බවත්, මිනිසුන්ගේ ගවයින් හමුදාවේ අවශ්‍යතාව සඳහා රඳවාගෙන සෙසු සතුන් විනාශ කළ යුතු බවටත් කැරැල්ල මැඩ පැවැත්වීමට යොදා සිටි **මේජර් මැක්ඩොනල්ට** උපදෙස් දී ඇත.[78]. තත්කාලීන අත්දැකීම් සහිත වූ **හෙන්රි මාර්ෂල්** පවසා ඇත්තේ මැක්ඩොනල්ඩ් කැරැල්ල මැඩ පැවැත්වීමේ අදහසින් ජනතාවට දැඩි දඬුවම් පැනවීම යෝග්‍ය බවට කල්පනා කරන ලද බවයි.[79] ඒ අනුව ජනතාවගේ නිවාස

---

[77] Wimalananda, T., 1970

[78] එම. පිට xlii

ගිනි තබා විනාශ කරන ලද බවත්, ඔවුන්ගේ ගවයින් සහ ධාන්‍ය ආදිය හේවායන් විසින් ගෙන ගොස් ඉතිරිය විනාශ කරන ලද බවත් ඔහු තවදුරටත් ප්‍රකාශ කර තිබේ. වෙල්ලස්සේ වැසියන් සතුවූ ජවය පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් **කර්නල් කැම්බල්** අදහස් දක්වා තිබේ. කැරැල්ල පැවැති කාලයේ දී පොල්ගස් විනාශ කිරීම, විශාල ඇළවේලි කඩා බිඳ කුඹුරු පාළු කිරීම සිදුකර ඇත.

ජලය රඳවා ගැනීම සඳහා මෙම බැමි අත්‍යවශ්‍ය බව සඳහන් කරන ඔහු ඒවා අලුත්වැඩියා කිරීමට අවුරුදු ගණනාවක් ගතවිය හැකි බව පෙන්වා දී තිබේ.[80]

උඩරට රාජධානිය ව්‍යාප්ත වූ ප්‍රදේශය ශ්‍රී ලංකාවේ බෙහෙවින් සමෘද්ධිමත් ප්‍රදේශයක් ලෙස ක්‍රියාත්මක වූ බව එම කලාපය ආශ්‍රිත ව හඳුනාගත හැකි පිහිටීම හා පුරාවිද්‍යාත්මක නටබුන් ඇසුරින් තහවුරු වේ. මෙම කලාපයේ ජනතාව සමෘධිමත් ජීවන ක්‍රියාවලියක නිරත විය. කෘෂිකාර්මික කටයුතු පදනම් කරගත් අර්ථ ක්‍රමයක් තුළ ජීවත් වූ උඩරට රාජධානියට අයත් ජනතාව සාහිත්‍ය, කලාව පෝෂණය කිරීමට සහාය දුන් අතර ඒ සඳහා සාම්ප්‍රදායික කුල යාන්ත්‍රණය ප්‍රයෝජනවත් වී ඇත. උඩරට සාමාන්‍ය ජනයා තුළ පවා රට ජාතිය කෙරෙහි තිබූ භක්තිය සහ ඇල්ම ඔවුන් ඉංග්‍රීසීන් ට විරුද්ධව එකාවන්ව කටයුතු කිරීම තුළින් මනාව ඔප්පුවේ. **වචන මාත්‍රයකින්වත් තම රට ජාතිය පාවා නොදීමක් නොකර සිටි සිවිල් සාමාන්‍ය වැසියන් එදා සමාජය තුළ සිටියහ.** තමන්ට ලද මරණීය වද හිංසාවන් මධ්‍යයේ වුවද තම රට වෙනුවෙන් කැපවීම් කළ පිරිසක් මෙම සටන සඳහා දායකත්වය ගෙන සිටින ලදි. උඩරට රාජධානි කලාපය ප්‍රදේශය ශ්‍රී ලංකාවේ බෙහෙවින් සමෘද්ධිමත් ප්‍රදේශයක් ලෙස ක්‍රියාත්මක වූ බවත් මෙම ජාතික සටන හේතුවෙන් එම තත්ත්වය සම්පූර්ණයෙන් ම වෙනස්වී ගිය බවත් හඳුනාගත හැකි ය. [1] Marshall, H., 1846, ***Ceylon; A genaral description of the island and its inhabitants with a historical sketch of the conquest of the colony by the English***, W.H.Allen and Co. London, pp. 187-88

---

[80] Campbell, J., 1843, ***Excursions, Adventuies and Field sport in Ceylon***, T and W Boones, London.